www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් -- 5 වන කොටස

## The Historical and International Foundations of the Socialist Equality Party—Part 5

*එක්සත් ජනදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් ලියවිල්ල කොටස් වසයෙන් පල කිරීම අපි ආරම්භ කර ඇත්තෙමු. පසුගිය අගෝස්තු 3-9 දිනවල පැවති සසප ආරම්භක සම්මේලනයේ දී මෙම ලියවිල්ල පුලුල් ලෙස සාකච්ඡා කරනු ලැබ ඒකමතිකව සම්මත කර ගන්නා ලදි. සම්මේලනයේ දී සම්මත කෙරුනු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද මීට පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය.*

### යුද්ධයේ අවසානය හා බෆර් රාජ්‍යයන්

95. යුද්ධය මඟින් යුරෝපීය ධනවාදය ආර්ථික වශයෙන් විනාශයට පත් කලේය. ධනේශ්වරයේ විශාල කොටස් නාසිවාදයට දැක්වූ ඔවුන්ගේ අනුග්‍රහය හේතු කොට ගෙන දේශපාලනිකව අපකීර්තියට පත්ව සිටියහ. මේ තතු තුල සෝවියට් තන්ත්‍රය හා එහි ස්ටැලින්වාදී පක්ෂ ජාලය කම්කරු පන්තිය දේශපාලන බලය අල්ලා ගැනීමෙන් වලකාලීමේ ලා තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටුකලහ. සෝවියට් හමුදා විසින් හිට්ලර්ගේ හමුදාවන් පරාජය කිරීමෙන් ශක්තිය ලබා සිටි ස්ටැලින්වාදීහු යුද්ධයේ අවසන් අදියරේ දී හා එහි අවසානයත් සමඟ ම වාගේ හටගෙන තිබුනු මහජන අරගල අවමංගත කිරීමට, සිය දේශපාලන අධිකාරය යොදා ගත්හ. ප්‍රන්සයේ, ඉතාලියේ හා ජර්මනියේ දී ප්‍රතිරෝධක සටන්කරුවන් නිරායුධ කිරීමටත් කම්කරු පන්තියේ කුමන හෝ ස්වාධීන මැදිහත් වීමක් මැඩීම සඳහා ත් සිය සහාය ධනේශ්වර ආන්ඩුවලට ලබාදෙන ලෙස ක්‍රෙම්ලිනය දේශීය කොමියුනිස්ට් පක්ෂවලට උපදෙස් දුන්නේය. පසුව ග්‍රීසියේ දී සෝවියට් නිලධරය කැරලි කරුවන්ට අත්‍යවශ්‍යවූ ආධාර ලබා දීම ප්‍රතික්ෂේප කරමින්, සිවිල් යුද්ධයේ දී ධනේශ්වර හමුදාවන්ගේ ජයග්‍රහනය සහතික කලහ.

96. නැගෙනහිර යුරෝපයේ දී මිලිටරි ආරක්ෂාව පිලිබඳ හේතු මත, එක්සත් ජනපදය විසින් හසුරුවන ධනේශ්වර රූකඩ තන්ත්‍රයන් පිහිටුවිය නොහැකි බව තීන්දු කල ක්‍රෙම්ලිනය, නැගෙනහිර ජර්මනිය, පෝලන්තය, හංගේරියාව, චෙකෝස්ලොවාකියාව, බල්ගේරියාව හා රුමේනියාව යන රටවල සිය අධිකාරිය යටතේ "බෆර් රාජ්‍ය" මාලාවක් පිහිටුවීය. එහෙත් මෙම රාජ්‍යයන්හි රාජ්‍ය දේපල පිහිටුවීම, සමහර අවස්ථාවල වසර ගනනාවක් ප්‍රමාද කල, සිදුවූයේ ක්‍රමානුකූලව කම්කරු පන්තියේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමත් සමඟය. ස්ටැලින්වාදී වර්ගයේ පොලිස් රාජ්‍ය තන්ත්‍රයන් පිහිටුවීම වනාහි, සමාජවාදී විප්ලවය ප්‍රසාරනය කිරීමක් නොව අවසාන විග්‍රහයේ දී දේශපාලනිකව ස්ථාවර වෙමින් පැවති පශ්චාත් - යුද්ධ යුරෝපීය සංස්ථිතික අරමුනු වෙනුවෙන් සේවය කිරීමේ විශේෂිත හා තාවකාලික වැඩ පිලිවෙලකි. යුගෝස්ලාවියාවේ දී ජනසතුකිරීම්, බෆර් රාජ්‍යයන්හි දී ට වඩා වෙනස් ආකාරයකින් සිදුවිය. ටිටෝ යටතේ කොමියුනිස්ට් පක්ෂය විසින් මෙහෙයවූ පාටිසන්වරු දෙවන ලෝක යුද්ධයෙන් පසුව බලයට පත්වූහ. කෙසේවුව ද බෆර් රාජ්‍යයන්හි දී මෙන්ම, ටිටෝ යටතේ පැලපදියම්වූ තන්ත්‍රය ද, කම්කරු පන්ති බල සංස්ථාවන් මත ස්වාධීනව පදනම් වූයේ නොවේ. දේශපාලන බලය ක්‍රියාත්මක කල හැකි සෝවියට් - වර්ගයේ තමන්ගේ ම දේශපාලන ආයතන ගොඩනැගීම කම්කරු පන්තියට තහනම්වූ අතර පාටිසන් යුද්ධයේ දායාදය වශයෙන්, යම් ප්‍රමානයක දේශපාලන නීති යුක්ත භාවයක් හා ස්ටැලින්වාදී පාලනය යටතේ පැවති අනෙක් රාජ්‍යයන්හි නොතිබුනු තරමේ ජනප්‍රියත්වයක් ටිටෝ වෙත උරුම වී තිබුනි. ටිටෝ තන්ත්‍රය ඉක්මනින්ම පොලිස් රාජ්‍යයක තත්වයට පිරිහී ගියේය. විවිධ ජාතික හා වාර්ගික ජන කොටස් මත පදනම් වූ එකිනෙකා සමඟ ගැටෙන නිලධරයේ කන්ඩායම් අතර බේරුම්කරුවෙකුගේ ක්‍රියාකලාපයක් ටිටෝ විසින් ඉටු කලේය. මෙම වාතාවරනයේ තුනී හා ශක්‍යතාවයෙන් තොර ස්වභාවය, 1980 ටිටෝගේ මරනින් පසුව හෙලිදරව් වී තිබේ.

### එක්සත් ජනපදය හා ධනේශ්වර පුනස්ථාපනය

97. සුනු විසුනුවී ගිය ලෝක ආර්ථික පද්ධතිය පිලිසකර කටයුතු ආරම්භ කිරීමටත්, සිය ආධිපත්‍ය පිටුවා ගැනීමටත්, එක්සත් ජනපදයට අත්‍යවශ්‍යව තිබූ ජීව වායුව ස්ටැලින්වාදයේ පාවාදීම් මඟින් සම්පාදනය කරනු ලැබිනි. යුද්ධයෙන් පසුව වඩාත් තිරසාර ආර්ථික වර්ධනයක අවධියක් සඳහා දොරටු විවර කරනු ලැබුනේ (1) යුද්ධයෙන් ආසියානු හා යුරෝපීය ආර්ථිකයන්ට සිදුවූ දැවැන්ත විනාශයේ ද (2) නිෂ්පාදන ක්‍රියාවලියේ වර්ධනයන් මත පදනම්වූ ඇමරිකානු කර්මාන්තයේ ආර්ථික ශක්තිය ද මතය. ඩොලර්-රත්රන් පරිවර්ත්‍යතාව

හා ස්ථාවර ජාත්‍යන්තර හුවමාරු අනුපාතිකය සමඟින් ඇමරිකානු ඩොලරය ලෝක සංචිත මූල්‍යයේ ක්‍රියාකලාපය ඉටුකල අතර, බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතිය නම් මූල්‍ය හා මුදල් යාන්ත්‍රනය හරහා ඇමරිකානු ධනවාදය, "ලෝකය ප්‍රතිසංවිධානය" කිරීමට උත්සාහ කලේය. අනෙකුත් ධනේශ්වර බලයන්ගේ ද ආධාරයෙන් ජාත්‍යන්තර ආර්ථික කටයුතු හැසිරවීම සඳහා එය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව වැනි ආයතන නිර්මානය කලේය. එක්සත් ජනපද ආර්ථිකයට ප්‍රසාරනය වීම සඳහා අත්‍යවශ්‍ය පදනම වූ යුරෝපීය හා ආසියානු ආර්ථික පුනර්ජීවනය දිරිගැන්වීමට, 1947 මාර්ෂල් සැලැස්මේ අරම්භයත් සමග ඇමරිකානු ධනවාදය උත්සුක විය. මෙම පදනම මත ධනේශ්වර පද්ධතියේ ඇමරිකානු ආධිපත්‍ය පිටුවන ලදී, යුද්ධයෙන් පසු කාලයේ ලෝක වෙලඳම වේගයෙන් ප්‍රසාරනය විය.

98. ලොව පුරා සියලු රටවල ජාතික ප්‍රතිසංස්කරන පිලිවෙත් සඳහා ද්‍රව්‍යමය පදනම දැමුනේ ජාත්‍යන්තර ආර්ථිකයේ ඇතිවූ මෙම පුනරුත්ථාපනයෙනි. එක්සත් ජනපදයේ දී ඇමරිකානු ධනේශ්වරය ඉල්ලුමෙන් තල්ලුවන කේනීසියානු පිලිවෙත් අනුගමනය කලහ. පශ්චාත් යුද්ධ වැඩ වර්ජන රැල්ලට ඔවුන් ප්‍රතිචාර දැක්වූයේ කාර්මික කම්කරුවන්ට සැලකිය යුතු ආර්ථික සහන ප්‍රධානය කරමිනි. එතැන් සිට සමාජ විප්ලවය මඟහැරීම සඳහා සැලසුම් කරනු ලැබූ නව ගිවිසුමේ ප්‍රතිසංස්කරන ප්‍රතිපත්තීන් අනුගමනය කලහ. ඒ අතර ම ඔවුන් දක්ෂිනාංශික ඒඑෆ්එල්-සීඅයිඕ වෘත්තීය සමිති නිලධරයේ ද සහාය ඇතිව, වෘත්තීය සමිති හා සමාජවාදී අදහස් දරන කම්කරුවන් ඇති අනෙකුත් ඇමරිකානු ආයතන ද, කොමියුනිස්ට් පක්ෂ සාමාජිකයන් ද, විරේක කර දැමීය. යුරෝපයේ දී ද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා වෘත්තීය සමිතිවල ක්‍රියාකාරී සහයෝගයෙන් ජාතිකව - පදනම් කල සමාජ ප්‍රතිසංස්කරන හා කම්කරු-කලමනාකරන සහයෝගීතාවේ එවැනි ම ක්‍රියාමාර්ගයක් අනුගමනය කලේය. එක්තරා ප්‍රමානයක නිදහසක් දිනාගත හැකිවූ, ආර්ථික වශයෙන් පසුගාමී හා පැරනි යටත්විජිත රටවල ජාතික ධනේශ්වර තන්ත්‍රයන් සෝවියට් සංගමය හා ඇමරිකාව අතර තුලනය වීමේ පිලිවෙතක් නිරන්තරයෙන් අනුගමනය කලේය. ආනයන ආදේශන කාර්මීකරනය ලෙස ප්‍රකටවූ ප්‍රතිපත්තියක් තුලින් ස්වදේශික කාර්මික සංවර්ධනයක හා කෘෂිකාර්මික ප්‍රතිසංස්කරනයන්හි සීමිත ප්‍රතිපත්තියක් ගෙනයාමට එම රටවලට හැකියාව ලැබුනි. නිලධරය විසින් අතිශයින් විකෘති කරනු ලැබුවේ වී නමුත් සෝවියට් සංගමයේ දී ස්ටැලින්වාදී නිලධරය ජාතික ආර්ථික සැලසුම් කරනයේ පදනම මත කර්මාන්තයේ සැලකිය යුතු වර්ධනයක් අත්විඳීය.

99. ජාත්‍යන්තර සම්බන්ධතාවන්හි දී ඒවා හැසිරවීම සඳහා එක්සත් ජාතීන් වැනි ආයතන පිහිටුවීම තුලින් ප්‍රමුඛ ධනේශ්වර බලවතුන් අතර සෘජු ගැටුම් අලුතින් පැනැගීම වලක්වාගැනීමට එක්සත් ජනපදය උත්සුක විය. යුද්ධාවසානය එක්සත් ජනපදය හා සෝවියට් සංගමය අතර "සීතල යුද්ධයේ" ගැටුම් වල ආරම්භය සලකුනු කලේය. එහි න්‍යෂ්ටික ඒකාධිකාරය සමඟ ඇමරිකානු ධනේශ්වරය කෙටි කලක් භුක්තිවිඳි උද්වේගය, සෝවියට් සංගමය පරමානු බෝම්බය අත්කර ගැනීමත් සමඟ වහාම දෙදරා ගියේය. ඉන් පසුව එක්සත් ජනපද දේශපාලන ප්‍රභූවේ, සෝවියට් සංගමය " අඩංගුකරගැනීම" දේශනා කල කොටස් හා මිලිටරි " හකුලාදැමීම" සඳහා දැනමුතුකම් දුන් අය අතර කටුක ගැටුමක් ඇවිල ගියේය. හොඳින්ම පෙනී ගියේ පසුව කී ආස්ථානය පූර්න-පරිමානයේ න්‍යෂ්ටික යුද්ධයක තර්ජනය එල්ල කරන බවයි. කොරියානු යුද්ධය අවධියේ 1950 දී, චීන හමුදා කොරියානු උප මහාද්වීපය තුලට ඇතුලුවීම නතර කිරීම සඳහා පරමානු බෝම්බ හෙලීමට තමන්ට ඉඩ දෙන ලෙස ජෙනරාල් ඩග්ලස් මැක් ආතර් ඉල්ලා සිටි විට, ධනේශ්වරය තුල ගැටුම එහි හිනි පෙත්තට ලඟාවිය. ට්‍රෘමන් මැක් ආතර් නෙරපා හලේය. "අඩංගුකරගැනීමේ" කන්ඩායම පෙරට ගියේය. තමන්ගේ පැත්තෙන් ස්ටැලින්වාදී නිලධරය "සාමකාමී සහජීවනය" නම් පිලිවෙත තුල ප්‍රකාශයට පත් අධිරාජ්‍යවාදය සමඟ සහයෝගීතාවයේ මූලෝපායික අරමුනක් එලිදැක්වූහ. එය "තනි රටක සමාජවාදය" පිලිබඳ න්‍යායේ තර්කාන්විත අන්තය විය. මෙම වැනෙන සුලු සතුරුකම් අත්හිටුවීම පවතිත් දිම "මහා බලවතුන්" දෙදෙන යෙදීසිටි න්‍යෂ්ටික අවි තරඟයේ දී හා ඌන සංවර්ධිත රටවල් තුල බලපෑම් පතුරවාලීම සඳහා තරඟයේ දී මහා පරිමාන ගැටුමක තර්ජනය නිරන්තරයෙන් හිස එසවීය.

## පශ්චාත් යුද කාලයේ මහජන නැගිටීම්

100. ලෝක ධනවාදයේ ආර්ථික පුනරුත්ථාපනයේ රාමුව තුල පශ්චාත් යුද්ධ අවධිය, යටත් විජිත පාලනය මඟින් පීඩාවට පත්කරන ලද ජනතාවගේ ද ජාත්‍යන්තර කම්කරු පන්තියේ ද දැවැන්ත නැඟිටීම් වලින් අංග ලක්ෂිත විය. ආසියාවේ, මැද පෙරදිග, අප්‍රිකාවේ හා ලතින් ඇමරිකාවේ මිලියන ගනන් කම්කරුවන් හා ගොවීන් යටත් විජිත විලංගු බිඳ දැමීමට උත්සාහ කලහ. මෙම අරගල නොනවතින විප්ලවයේ න්‍යායෙහි ද, චීන විප්ලවයේ ස්ටැලින්වාදී පාවාදීම්වලට එරෙහිව ට්‍රොට්ස්කිගේ අරගලයේ පාඩම්වල ද, ඉමහත් අදාලත්වය ඉස්මතු කලේය. යලිදු වතාවක් එයින් එලිමහනට ගෙන ආවේ, ධනවාදයේ ඉතිරි පහදු විරේක කිරීම හා ලැටිෆුන්ඩා නම්, යටත් විජිත පාලනය අවසන්කර ජාතික ස්වාධීනත්වය පිහිටුවීමේ අරමුන ද, දුගී භාවය අවසන් කිරීම සඳහා ආර්ථික ජීවිතය සංවිධානය කිරීම ද, මහජනතාවගේ

සමාජ හා සංස්කෘතික මට්ටම නැංවීම ද ඇතුලු අධිරාජ්‍ය විරෝධී අරගලය විසින් මතුකල අත්‍යවශ්‍ය ගැටලු නිරාකරනය කරගත හැක්කේ, අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී හා ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියාමාර්ගයකින් සන්නද්ධ වූ විප්ලවවාදී කම්කරු පන්තික නායකත්වයක් යටතේ පමනක් බවය. එහෙත් එවන් ක්‍රියාමාර්ගයක හා ඉදිරිදර්ශනයක වෛෂයික අවශ්‍යතාවය ස්ටැලින්වාදී මුක්කු බලය යටතේ පැවති, අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයේ ජාතික ධනපති ආධිපත්‍යයට එරෙහිව මුහුනට මුහුන ලා පිහිටා සිටියි.

101. ඉන්දියාවේ අධිරාජ්‍ය විරෝධී අරගලය 1947-48 කාලයේ ගාන්ධි, නේරු හා ධනපති කොන්ග්‍රස් පක්ෂය විසින් විනාශකාරී ලෙස පාවාදීමෙන්, නොනවතින විප්ලවයේ න්‍යාය සනාථ කරනු ලැබිනි. ප්‍රධාන වශයෙන් හින්දු ඉන්දියාව හා මුස්ලිම් පකිස්ථානය වශයෙන් ඉන්දියාව බෙදා වෙන්කිරීම එරට ධනේශ්වරය විසින් පිලිගැනීම, මිලියන 10කගේ පමන ජීවිත බිලිගත් ක්ෂනික වාර්ගික ගැටුම්වලට තුඩු දුන්නේය. බෙදීමේ බිහිසුනු උරුමය වාර්තාගත වූයේ, දශක ගනනාවක යුද්ධය, ප්‍රචන්ඩ හා දිග් ගැස්සෙන ජනතාවගේ දුගී භාවය ලෙසය. එක් හෝ තවත් ආකාරයකින් කම්කරු පන්තිය ධනේශ්වර-නායකත්වය යටතේ වූ ජාතික ව්‍යාපාරයන්ට යටත් කිරීම, රටක් රටක් පාසා දේශපාලන ව්‍යසනයන්ට මඟ පෑදීය. අධිරාජ්‍ය විරෝධී මහ ජනතාව අතර සිය දේශපාලන අධිකාරය පිහිටුවා ගැනීම සඳහාත්, බලය අල්ලා ගැනීම සඳහාත් කම්කරු පන්තිය ගෙනගිය අරගලයට, පලමුව ධනේශ්වර නායකත්වය යටතේ නිදහස හා නොදන්නා අනාගතයේ යම් අවස්ථාවක දී පමනක් සමාජවාදය යන ස්ටැලින්වාදීන් විසින් නිරන්තරව ඉදිරිපත් කල ඔවුන්ගේ පන්ති සහයෝගිතා "අවධි දෙකේ" අරගලය පිලිබඳ න්‍යාය මඟින්, වැට කඩොලු බැඳීය.

102. ස්ටැලින්වාදීන්ගෙන් තියුනු ලෙස වෙනස් ලංකාවේ (දැන් ශ්‍රී ලංකාව) ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය, ඉන්දියානු බොල්ශෙවික්-ලෙනින්වාදී පක්ෂය (බීඑල්පීඅයි) ලෙස සංවිධානය වෙමින් මූලධර්මාත්මක හා ජාත්‍යන්තරවාදී ආස්ථානයක පිහිටා සිටියේය. නිල වශයෙන් යටත් විජිත තත්වය අවසන් කල බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය හා ජාතික ධනේශ්වරය විසින් සාකච්ඡාවට බඳුන් කල දේශපාලන විසඳුමට එය විරුද්ධ විය. ශ්‍රී ලංකාවේ ධනේශ්වරය බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි අරගලයේ වැදගත් ක්‍රියාකලාපයක් ඉටුකල ජනතාවගේ ම, එනම් දෙමල වතු කම්කරුවන්ගේ, පුරවැසි භාවය අහෝසි කිරීම සඳහා පුරවැසි පනත් ගෙන ඒමත් සමග බීඑල්පීඅයි ආස්ථානය කල් නොයවා ම සනාථ කෙරුනි. නිදහසේ පටන් ම සිංහල ධනපති පන්තිය කම්කරු පන්තියේ එක්සත් ව්‍යාපාරයක් වැලැක්වීම හා සමාජ ප්‍රතිවිරෝධයන් පීලි පැන්නවීම සඳහා ප්‍රධාන මාධ්‍යය ලෙස යොදා ගත්තේ දෙමල සුලුතරයට එරෙහි වර්ගවාදය ඇවිස්සීමයි.

## චීන විප්ලවය

103. චීනයේදී ජාතික ව්‍යාපාරය, චීන කොමියුනිස්ට් පක්ෂයේ ඍජු නායකත්වය යටතේ ගොවි ජන නැගිටීම්වල රූපය ගත්තේය. 1927 ලැබූ විනාශකාරී පරාජයෙන් පසුව කොමියුනිස්ට් පක්ෂය ගම්බද බලා පසු බසිමින් ගොවි ජන කොටස්වල ද සහයෝගය ඇතිව "රතු හමුදා" ගොඩනැගුහ. කෙසේවුව ද කොමියුනිස්ට් පක්ෂය සිය නව දිශානතිය, උපායාත්මක හා ක්‍රියාමාර්ගික පදනමක යුක්තිසහගත කිරීමට උත්සාහ කල ද, නාගරික හා කම්කරු පන්තික පදනම් අතහැර දැමීම මඟින් එහි දේශපාලන හා සමාජ ස්වභාවය, ප්‍රගාඪ වෙනසකට බඳුන් කලේය. චීන ස්ටැලින්වාදීන්ගේ මූලික මහජන පදනම ගම්බද ගොවීන් බවට පත්වීමේ කාරනය, නොකඩවා මාක්ස්වාදී වාක්‍ය ඛන්ඩ දෙඩවීමේ ඔවුන්ගේ චර්යාව මඟින් වෙනස් නොකලේය. 1927 පරාජයට පෙරාතුව චීන කොමියුනිස්ට් පක්ෂයේ (සීසීපී) දක්ෂිනාංශය තුල ස්ථානගතව සිටි මාවෝ සේතුං, පක්ෂයේ මූලෝපායික දිශානතිය හා සමාජ පදනම වෙනස් කිරීමේ ලා ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටු කලේය.

104. 1927 දී රුසියානු කොමියුනිස්ට් පක්ෂයෙන් ද කොමියුනිස්ට් ජාත්‍යන්තරයෙන් ද නෙරපා හැරීමෙන් පසුව ට්‍රොට්ස්කි, චීනයේ වර්ධනයන් ප්‍රවේශමෙන් හැදෑරීමට පටන් ගත්තේය. 1932 දී චීනයේ වාම විපාර්ශවය වෙත යොමුකල ලිපියකින් ඔහු සීසීපීයේ දේශපාලන හා සමාජ විද්‍යාත්මක පරිනාමයේ ඇඟවුම් සමාලෝචනය කලේය. ගොවි ව්‍යාපාරය මත පදනම්ව කොමියුනිස්ට් පක්ෂය බලයට පත් වුවහොත් අවසාන විග්‍රහයේ දී එහි ප්‍රතිපත්තීන් පිලිබිඹු කරනු ඇත්තේ මෙම සමාජ පදනමේ අවශ්‍යතාවන් හා පෙනුමයි. කම්කරුවන් හා ගොවීන් අතර ගැටුමක් ට්‍රොට්ස්කි කල්තියාම දැක ගත්තේය. ඔහු මෙසේ ලිවීය. "මහා ඉඩම් හිමියන්ට, යුදවාදීන්ට, වැඩවසම්වාදීන්ට හා පොලී කාරයන්ට එරෙහිව යොමුවන තාක් දුරට ගොවි ව්‍යාපාරය යෝධ විප්ලවකාරී සාධකයක් ලෙස පවතියි. එහෙත් ගොවි ව්‍යාපාරය තුලම ඉතා බලගතු දේපල හිමිකමේ හා ප්‍රතිගාමීත්වයේ ප්‍රවනතා පවතින අතර, නිශ්චිත අදියරක දී එය කම්කරුවන්ට සතුරුකම් පෑමේ හා එම සතුරුකම්, ඔවුන් දැනටමත් ආයුධ සන්නද්ධව සිටීම නිසා ශක්තිමත් විය හැකිය. ගොවිජනතාවගේ මෙම ද්විත්ව ස්වභාවය අමතක කරන්නා මාක්ස්වාදියෙකු නොවේ. "කොමියුනිස්ට්වාදීන්" අතර ලේබල් සහ ධජ පතාකවලින් සැබෑ සමාජ ක්‍රියාවලීන් වෙන්කර හඳුනාගැනීමට වැඩි දියුනු කම්කරුවන් උගන්වා ගත යුතුය."[66]

105. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ජපානයේ මිලිටරි ග්‍රහනය බිඳ වැටීමත් සමඟ සීසීපී ය දියත් කල ප්‍රහාරය අවසන් වූයේ 1949 ඔක්තෝබරයේ දී දේශපාලන බලය අල්ලා ගැනීමෙන්ය. මාවෝගේ ජයග්‍රහනය ඔහුගේ මූලෝපායික "ප්‍රතිභාවට" හිමිකර දෙන්නේ - 1949 ට පෙර හෝ පසුව ඒ පිලිබඳව ඇති මඳ සාක්ෂි දෙස බලන විට - ජපන් අධිරාජ්‍යයේ මිලිටරි බිඳවැටීම මඟින් නිර්මානය කල අසාමාන්‍ය ලෙස හිතකර කොන්දේසි මාලාවට වඩා අඩු තැනකි. තවද, ජපානයේ කඩාවැටීමෙන් පසුව පවා සීසීපී ය යලි යලිත් උත්සාහ කලේ චියාං කායි-ෂෙක් හා කෝමිංටෑනය සමඟ යම් වර්ගයක දේශපාලන විසඳුමක් සඳහා සාකච්ඡාවලට එලඹීමට ය. දේශපාලන සම්මුතියක මාවත අවහිර කලේ මාවෝගේ අධිෂ්ඨානයට වඩා චියාංගේ දැඩි ස්ථාවරය මඟිනි. අවසානයේ දී සීසීපී ය, චියාං පෙරලා දැමීම දේශපාලන අවශ්‍යතාවක්ය යන නිගමනය කරා අකැමැත්තෙන් නමුත් එලඹුනේ ය.

106. මාවෝ තන්ත්‍රය ඉඩම් හිමියන් අස්වාමික කිරීම ද ඇතුලු ධනේශ්වර ජාතිකවාදී පියවර ක්‍රියාවට නැඟූ නමුත් කම්කරු පන්තිය කෙරෙහි ද දැඩි සතුරු කමක් දැක්වීය. 1927 පරාජයෙන් පසුව නාගරික කම්කරු මධ්‍යස්ථානවල ක්‍රියාශීලීව සිටි චීන ට්‍රොට්ස්කිවාදීන් මාවෝ තන්ත්‍රය විසින් රුදුරු ලෙස මඩිනු ලැබිනි. සැලකිය යුතු උපාමාරු දැමීම්වලින් පසුව තන්ත්‍රය, චීන කර්මාන්තයෙන් වැඩි කොටසක පාලනය සියතට ගත්තේය. සීසීපී ය ස්ටැලින් වර්ගයේ නිලධාරිවාදී පොලිස් රාජ්‍යයක් ගොඩනැඟීය. එය, කර්මාන්ත ජනසතු කිරීමත්, විරුද්ධ පාර්ශවයන්, විශේෂයෙන්ම වමෙන් මතුවන, රුදුරු ලෙස මැඬපැවැත්වූ අභ්‍යන්තර තන්ත්‍රයක් සහිත සමාජවාදී පුරාජේරුවත් එකට බද්ධ කලේය. ඊනියා "මහා ඉදිරි පිම්ම" ද ඇතුලත් සීසීපීයේ ජාතිකවාදී පිලිවෙත් ව්‍යසනකාරී ප්‍රති විපාක ගෙන ආවේය. ගනන් බලා ඇති පරිදි මිලියන 30 කට මරු කැඳවූ දුර්භික්ෂය ද මීට ඇතුලත්ය. ජාත්‍යන්තර කරලියේ දී මාවෝවාදීන්, 1965-66 කාලයේ දී සීඅයිඒ සංවිධානයේ පිටුබලය සහිතව ඉන්දුනීසියානු මිලිටරිය හා ප්‍රති කොමියුනිස්ට්වාදී සන්නද්ධ කල්ලි විසින් මිලියනයක් කම්කරුවන් හා ගොවීන් ඝාතනය කිරීම ද, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මැදිහත් වීමට දොර විවර කල, ප්‍රන්ස අධිරාජ්‍යවාදීන් සමඟ ස්ටැලින්වාදීන් කප්පුකම් කල 1954 වියට්නාමය බෙදීම ද ඇතුලු ආසියාව පුරා ව්‍යසනකාරී ප්‍රතිවිපාක ඇතිකල, පසුගාමී රටවල ජාතික ධනේශ්වරය සමඟ සන්ධානය පිලිබඳ ස්ටැලින්වාදී න්‍යාය යහමින් පවත්වා ගෙන ගියේය.

## ඊස්රායලය පිහිටුවීම

107. බ්‍රිතාන්‍ය වැයික්කියක් වූ පලස්තීනය බෙදීම මඟින් 1948 දී ඊස්රායලය පිහිටුවීම තුල, ජාතිකව-පදනම්වූ දේශපාලන හා ප්‍රතිසංස්කරන පිලිබඳ මූලධර්මයේ කිසියම් වෙනස් ප්‍රකාශනයක් දැකගත හැකිය. යුදෙව් රාජ්‍යයක් ලෙස ඊස්රායලය පිහිටුවීම දෙස ලෙව පුරා මිලියන ගනනක් මිනිස්සු බලා සිටියේ, ආසන්න වශයෙන් යුරෝපීය යුදෙව් ජනගහනයෙන් තුනෙන් දෙකක ජීවිත බිලිගත් මහා ජන සංහාරයත් ඇතුලු, ඒ වන විට හෙලිදරව් වීමට පටන් ගෙන තිබූ යුදෙව් භීෂනය හේතු කොට ගෙන පලාගියවුන් වෙනුවෙන් කරන වැඩක් ලෙස අනුකම්පාවෙනි. කෙසේ වෙතත් වෛෂයික හේතු සාධක අනුව ඊස්රායලය නිර්මානය කිරීම සමාජීයව හා දේශපාලනිකව ප්‍රතිගාමීය. එය පදනම් වූයේ වාර්ගික-ආගමික මූලධර්මය හා ඔවුන්ගේ නිජබිම් තුලින් පලවා හැරි පලස්තීනුවන්ගේ භූමි භාගයන් අත්පත්කර ගැනීම මතය. ඊස්රායල් රාජ්‍යය පසු කාලයේ දී සේවය කලේ මැද පෙරදිග ඇමරිකානු අවශ්‍යතාවන් ආරක්ෂා කිරීමේ ප්‍රධාන හමුදා බැරැක්ක රාජ්‍යයක් ලෙසය. යුදෙව් හා අරාබි ජනතාවන්ට ඛේදවාචකයක්වූ මෙම තත්වය නිර්මානය කල හැකි වූයේ, ස්ටැලින්වාදයේ පාවාදීම් හා සමාජවාදී අදහස් දැරූ බොහෝ යුදෙව්වන් සියොන්වාදය දෙසට තල්ලුකර හැරි, එහි යුදෙව්වාදී විරෝධයට පින්සිදු වන්නටය. 1920 ගනන්වල දී පලස්තීන කොමියුනිස්ට් පක්ෂය යුදෙව් හා අරාබි කම්කරුවන්ගේ ඒකාබද්ධ ව්‍යාපාරයක් සඳහා සටන්වැද තිබුනි. කෙසේවුව ද ස්ටැලින්වාදී පක්ෂවල ජාතිකවාදී පරිහානිය, දෙවන ලෝක යුද්ධය අවසන් වීමට පෙරාතුව ම වාර්ගික රේඛා ඔස්සේ කොටස් දෙකකට කැඩී ගිය පලස්තීන කොමියුනිස්ට් පක්ෂය තුලින් පිලිබිඹු විය. සෝවියට් නිලධරය කලාපයේ කම්කරු පන්තිය පාවාදීම පරිසමාප්තියට ගෙන ආවේ, අධිරාජ්‍යවාදය සමඟ සිය පශ්චාත් යුද්ධ ගිවිසුම්වල කොටසක් ලෙස ඊස්රායලය නිර්මානය කිරීමට සහාය දීම මඟිනි. ඊට පටහැනි ලෙස හතරවන ජාත්‍යන්තරය, කම්කරු පන්තියේ එකමුතුව මත පදනම්කල ජාත්‍යන්තරවාදී ආස්ථානයක් වර්ධනය කලේය. 1948 දී එය මෙසේ සඳහන් කලේය.

> යුදෙව් ප්‍රශ්නය පිලිබඳ "සියොන්වාදී විසඳුම" මනෝරාජික හා ප්‍රතිගාමී එකක් ලෙස සලකන හතරවන ජාත්‍යන්තරය එය ප්‍රතික්ෂේප කරයි. සියොන්වාදය මුලුමනින්ම ප්‍රතික්ෂේප කිරීම, යුදෙව් කම්කරුවන් අරාබි පීඩිතයන්ගේ ජාතික, සමාජ හා විමුක්ති අරගල සමඟ බද්ධ කිරීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියක් බව එය කියා සිටියි. පලස්තීනයට සංක්‍රමනය වන ලෙසට යුදෙව්වන්ගෙන් ඉල්ලීම, පොදුවේ කුමන හෝ පීඩක ජනතාවකට යටත් විජිත රටවලට සංක්‍රමනය වන ලෙස ඉල්ලීම මෙන්ම තරයේ ම ප්‍රතිගාමී බව ද එය කියා සිටියි. සංක්‍රමනය පිලිබඳ ප්‍රශ්නය මෙන්ම යුදෙව් හා අරාබි වරුන්

අතර සම්බන්ධතාව ද යෝග්‍ය පරිදි තීරනය කල හැක්කේ, යුදෙව්වන්ට ජාතික සුලුතරයක් ලෙස පූර්න අයිතිය සහිත, නිදහස් ලෙස පත් කර ගත් ව්‍යවස්ථාදායක සභාවක් මගින් අධිරාජ්‍යවාදය ඉවත් කිරීමෙන් පසුව පමනකි. [67]

## කොරියානු යුද්ධය

108. චීන විප්ලවය ලඟට පශ්චාත් යුද්ධ යටත් විජිත විරෝධී නැගිටීම්වල වඩාත් පුපුරන සුලු ප්‍රකාශනය දැකගත හැකි වූයේ 1950 ජූනි මාසයේ පැනනැගි කොරියානු යුද්ධය තුලය. ස්ටැලින්වාදී නායකත්වය යටතේ උතුරු කොරියානු සන්නද්ධ හමුදාවන් ඉක්මනින්ම, දකුනු කොරියාවේ එක්සත් ජනපද පිටුබලය ලත් ආඥාදායක සිංග්මන් රී ගේ හමුදාවන් පසුබැස්වීය. එක්සත් ජනපද ජනාධිපති ට්‍රෑමන් එක්සත් ජාතීන්ගේ යෝජනාවක ආවරනය යටතේ හමුදා යැවීමෙන් පසුව අර්ධද්වීපයේ වැඩි කොටසක් යලි අත්පත් කර ගත්තේය. එක්සත් ජනපද හමුදා චීන දේශ සීමාව වෙත ලඟාවෙද්දී, චීන හමුදාවන් ද ගැටුමට මැදිහත් විය. ඇමරිකානු හමුදාවන් පසුබැස ගිය අතර අවසානයේ දී, පූර්ව යුද්ධ සීමාවන්ට දල වශයෙන් අනුරූප වන මායිමකට සටන් සීමාවිය. ඇමරිකානු එස්ඩබ්ලිව්පීය, කැනන්ගේ නායකත්වය යටතේ, කොරියානු ජනතාව මොස්කෝවේ රූකඩයන්ට වැඩි පිරිසක් නොවේ ය යන කියාපෑම් ප්‍රතික්ෂේප කරමින් අරගලය, දිග හැරෙන යටත් විජිත විප්ලවයේ සංදර්භය තුල පිහිටුවාලීය. එක්සත් ජනපද ආන්ඩුව වෙත යොමුකල ලිපියක කැනන් මෙසේ ප්‍රකාශ කලේ ය. "කොරියාවේ ඇමරිකානු මැදිහත් වීම වනාහි මිනීමරු අධිරාජ්‍යවාදී කුමන්ත්‍රනයකි. එය ඉන්දු චීනයේ ප්‍රන්ස යුද්ධයෙන් හෝ ඉන්දුනීසියාවේ ලන්දේසි ප්‍රහාරයෙන් හෝ වෙනස් නො වේ. ඇමරිකානු කොල්ලන් සැතපුම් 10,000 ක් දුර බැහැරට යවා ඇත්තේ කොරියානු ජනතාව විමුක්ත කර ගැනීමට නොව ඔවුන් පරාජය කර යටත් කර ගැනීමට ය. එය ප්‍රකෝපකාරී මෙන්ම පිලිකුල් සහගත ය." කොරියානු අරගලය වනාහි බටහිර අධිරාජ්‍යවාදයට එරෙහිව ආසියාව සිසාරා "මිලියන සියගනනක් යටත් විජිත ජනතාවගේ යෝධ නැගිටීමක කොටසකි." [68]

109. කොරියානු ගැටුම පැහැදිලිව ම පෙන්නුම් කලේ සෝවියට් සංගමය නව වර්ගයක පන්ති සමාජයක, එක්කෝ "නිලධාරිවාදී සාමුහිකකරනයේ" නැත්නම් " රාජ්‍ය ධනවාදයේ" නව රූපාකාරයක්, බවට පත්ව ඇතැයි යන න්‍යායන්ගේ ප්‍රතිගාමී ඇඟවුම් ය. " නිලධාරිවාදී සාමුහිකකරනයේ" න්‍යායවාදියා වූ මැක්ස් ෂැට්මන්, මීට දස වසරකට පෙර හතරවන ජාත්‍යන්තරයෙන් බිඳී ගියේ ස්වාධීන "තෙවෙනි කඳවුරක්" ගොඩනගන බවට පොරොන්දු වෙමිනි. එහෙත් 1950 දී ඔහු විවෘතව ම ඇමරිකානු අධිරාජ්‍යවාදී කඳවුරට සේන්දු විය. එවකට, ව'කර්ස් පාටි ලෙස හඳුන්වා ගත් ෂැට්මන්ගේ සංවිධානය විසින් සූදානම් කල පත්‍රිකා, චීන හා උතුරු කොරියානු සෙබලුන් වෙත ගුවනින් හෙලනු ලැබුවේ ඇමරිකානු ආක්‍රමනිකයාට යටත් වීම සඳහා "සමාජවාදී" කුතර්කයන් ද පිලිගන්වමිනි. "රාජ්‍ය ධනවාදය" පිලිබඳ දෘෂ්ටියේ ප්‍රමුඛ නියෝජිතයා වූ ටෝනි ක්ලිෆ්, අධිරාජ්‍යවාදී යුද්ධය කෙරෙහි කැනන්ගේ අශමනීය විරුද්ධත්වය මත දැඩිව පිහිටා ගත්, එවක හතරවන ජාත්‍යන්තරයේ බ්‍රිතාන්‍ය ශාඛාව වූ රෙවලූශනරි කොමියුනිස්ට් පාටියෙන් කැඩී ගියේ ය. එහි දී ක්ලිෆ් වැලඳගත්තේ එක්සත් ජනපදය හා සමානව ම ඔහු විසින් හැඳින්වූ "රුසියානු අධිරාජ්‍යවාදය" ත් හෙලාදැකීමේ දැඩි මධ්‍යස්ථ ආස්ථානයකි.

## මතු සම්බන්ධයි

## සටහන්

[66] *Leon Trotsky on China,* චීනය ගැන, ලියොන් ට්‍රොට්ස්කි, 586 වන පිට.

[67] Second World Congress of the Fourth Interítioíl "Struggle of the Colonial Peoples and the World Revolution," *Fourth Intenational ,* හතරවන ජාත්‍යන්තරයේ දෙවන ලෝක සමුලුව, "යටත් විජිත ජනතාවන්ගේ අරගල හා ලෝක විප්ලවය" හතරවන ජාත්‍යන්තරය, 1948 ජූලි කලාපය, 157 පිටුව.

[68] *.Fourth International*, හතරවන ජාත්‍යන්තරය, 1946 නොවැම්බර්, පි. 345.

© www.wsws.org